අන්තර්ජාතික මානුෂවාදී නීතිය පිළිබඳ
**උපදේශන සේවාව**

# අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු කුමක්ද?

**අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු කුමක්ද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු මානුෂවාදී හේතු උදෙසා, සන්නද්ධ ගැටුමක බලපෑම් සීමා කිරීම අරමුණු කොටගත් රීති සමුදායකි. සටනට සහභාගි නොවන හෝ තවදුරටත් සටන් නොවදින පුද්ගලයින් ආරක්ෂා කිරීමත් යුද විධි ක්‍රම සහ ආකාර සීමා කිරීමත් එමගින් සිදුකරයි. අන්තර්ජාතික මානුෂවාදී නීතිය, යුද නීතිය හෝ සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතිය ලෙස ද හඳුන්වනු ලබයි.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය, රාජ්‍යයන් අතර පවතින සබඳතා පාලනය කරනු ලබන නීති පද්ධතිය වන අන්තර්ජාතික නීතියෙහි කොටසකි. අන්තර්ජාතික නීතිය, ගිවිසුම් හෝ සම්මුතීන් වැනි රාජ්‍යයන් අතර බලපවත්නා එකඟතාවයන් සහ රාජ්‍යයන් විසින් නෛතිකව බැඳෙන බවට සලකනු ලබන රාජ්‍ය පරිචයන්ගෙන් සැදුම්ලත් චාරිත්‍රානුකූල නීති සහ පොදු මූලධර්මයන් තුළ අන්තර්ගත වේ.

අන්තර් ජාතික මානුෂවාදී නීතිය සන්නද්ධ ගැටුම් සඳහා අදාළ වේ. එය රාජ්‍යයක් විසින් සැබෑ ලෙසම බලය යොදවන්නේද නැද්ද යන්න පාලනය කිරීමක් නොකරන අතර අතිශය වැදගත් එමෙන්ම සුවිශේෂී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය තුළ ඇතුළත් අන්තර්ජාතික නීතියේ කොටසක් මඟින් පාලනය වනු ලබයි.

**අන්තර්ජාතික මානුෂවාදී නීතිය ආරම්භ වූයේ කොතනින්ද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය, අතීත ශිෂ්ටාචාර සහ ආගම්හි රීතින් මත මුල්බැස ගන්නා ලද්දකි. යුද්ධයන් යම් නිශ්චිත මූලධර්ම සහ චාරිත්‍රයන්ට සැම කල්හිම යටත්ව පැවතිණි.

අන්තර්ජාතික මානුෂවාදි නීතියේ විශ්වීය සංග්‍රහගත කිරීම ආරම්භ වූයේ දහ නවවන සියවසේදී ය. එවක සිට නූතන යුද්ධයන්හි සිය අම්හිරි අත්දැකීම් මත පදනම්ව රාජ්‍යයන් විසින් ප්‍රායෝගික නීති සමුදායකට සිය එකඟත්වය පළකරන ලදි. මෙකී රීතින් මඟින් මානුෂවාදී අපේක්ෂාවන් සහ රාජ්‍යයන්ගේ හමුදා අවශ්‍යතා අතර සියුම් තුලනයක් ගොඩනඟයි.

ජාත්‍යන්තර ප්‍රජාවේ වර්ධනයත් සමඟ රාජ්‍යන් වැඩි ප්‍රමාණයක් එකී රීතීන්ගේ වර්ධනයට දායක වී ඇත. අද වනවිට අන්තර්ජාතික මානුෂවාදී නීතිය, විශ්ව නීති සමුදායක් බවට පත්ව තිබේ.

**අන්තර්ජාතික මානුෂවාදී නීතිය සොයාගත හැක්කේ කොහෙන්ද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි විශාල කොටසක් 1949 ජිනීවා සම්මුති හතර තුළ ඇතුළත්ය. ලෝකයේ සෑම රාජ්‍යයක්ම පාහේ මෙමඟින් බැඳීමට එකඟ වී ඇත. මෙම සම්මුතීන් වැඩිදුර එකඟතාවයන් දෙකක් මඟින් වැඩිදියුණු කර පරිපූර්ණය කොට ඇත: සන්නද්ධ ගැටුම් හි වින්දිතයින් ආරක්ෂාකර ගැනීමට අදාළ 1977 අතිරේක සන්ධාන.

අනෙකුත් එකඟතාවයන් මඟින් යම් නිශ්චිත ආයුධ සහ යුද උපක්‍රම යොදා ගැනීම වළක්වාලමින් යම් නිශ්චිත පුද්ගල කාණ්ඩයන් සහ භාණ්ඩ ආරක්ෂා කරනු ලබයි. පහත එකඟතාවයන් මීට ඇතුළත් වේ:

- 1954 සන්නද්ධ ගැටුම් අවස්ථාවකදී සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය සහ එහි සන්ධාන ද්විත්වය;
- 1972 ජීව විද්‍යාත්මක අවි පිළිබඳ සම්මුතිය;
- 1980 සාම්ප්‍රදායික අවි පිළිබඳ සම්මුතිය සහ එහි සන්ධාන පහ
- 1993 රසායනික අවි පිළිබඳ සම්මුතිය
- 1997 පුද්ගල නාශක බිම් බෝම්බ තහනම් කිරීම පිළිබඳ ඔටාවා සම්මුතිය
- සන්නද්ධ ගැටුමක ළමුන්ගේ මැදිහත්වීමට අදාළ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 2000 වෛකල්පික සන්ධානය

අද වන විට අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි බොහෝ විධිවිධානයන් චාරිත්‍රානුකූල නීතිය ලෙස පිළිගෙන තිබේ. චාරිත්‍රානුකූල නීතිය නම් සෑම රාජ්‍යයක් විසින්ම පිළිගැනීමට බැඳෙන පොදු රීති සමුදායකි.

**අන්තර්ජාතික මානුෂවාදී නීතිය අදාළ වන්නේ කුමන අවස්ථාවේදී ද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සන්නද්ධ ගැටුම් සඳහා පමණක් අදාළවේ; එමගින් හුදෙකලා ප්‍රචණ්ඩකාරී ක්‍රියා වැනි අභ්‍යන්තර ආතතීන් හෝ කලහකාරී තත්ත්වයන් ආවරණය නොකරයි. මෙම නීතිය ගැටුමක් ආරම්භ වූ විටෙකදී පමණක් බලපාන අතර ඉන් පසුව එකී ගැටුම කවුරුන් විසින් ආරම්භ කළේද යන්න නොතකා සමානව සෑම පාර්ශවයක් කෙරෙහිම අදාළ වේ.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් අන්තර්ජාතික සහ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් වෙන් කොට හඳුනාගනී. අන්තර්ජාතික සන්නද්ධ ගැටුම් යනු අවම වශයෙන් රාජ්‍යයන් දෙකක්වත් සම්බන්ධවන ගැටුමය. මෙම ගැටුම් ජිනීවා සම්මුතීන් හතර සහ පළමු අතිරේක සන්ධානයේ නීති ද ඇතුළත්ව පුළුල් පරාසයක විහිදී නීති ගණනාවකට යටත්වේ.

අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් යනු එක් රාජ්‍යයක දේශ සීමාවකට පමණක් සීමාවූ, එක්කෝ සාමාන්‍ය සන්නද්ධ බලකා විසින් විරුද්ධවාදී සන්නද්ධ කණ්ඩායම් සමඟ හෝ නැතහොත් සන්නද්ධ කණ්ඩායම් එකිනෙකා සමඟ හෝ සිදු කරන්නකි. වඩා සීමාසහිත වපසරියක දිවෙන රීති අභ්‍යන්තර සන්නද්ධ

ගැටුම් සඳහා බලපාන අතර ඒවා ජිනීවා සම්මුති හතර සඳහාම පොදු 3 වන වගන්තිය තුළ සහ දෙවන අතිරේක සන්ධානය තුළ දක්වා ඇත.

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ මානව අයිතිවාසිකම් නීතිය වෙන්කොට දැක්වීම ඉතා වැදගත්ය. මෙම නීති දෙවර්ගයෙහි සමහරක් රීතින් සමාන වුවද, මෙම නීති පද්ධති ද්විත්වය වෙන් වෙන්ව වර්ධනය වී ඇති අතර විවිධ ගිවිසුම් තුළ ඇතුළත් වේ. විශේෂයෙන්ම, අන්තර්ජාතික මානුෂවාදී නීතිය මෙන් නොව මානව අයිතිවාසිකම් නීතිය සාමකාලය තුළදී අදාළවන අතර එහි බොහොමයක් වගන්තීන් සන්නද්ධ ගැටුම් පවතින කාලය තුළදී අත්හිටු විය හැක.

**අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් ආවරණය කරන්නේ මොනවාද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය මගින් ක්ෂේත්‍ර දෙකක් ආවරණය කරනු ලබයි.

- සටනට සහභාගි නොවන හෝ තවදුරටත් සටන් නොවදින පුද්ගලයින් ආරක්ෂා කිරීම

- යුද ආකාර - විශේෂයෙන්ම ආයුධ සහ හමුදා උපායමාර්ග වැනි යුද විධික්‍රම සඳහා සීමා පැනවීම

**"ආරක්ෂණය" යනු කුමක්ද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය සිවිල් වැසියන්, වෛද්‍ය හා ආගමික හමුදා සාමාජිකයින් වැනි සටනට සහභාගී නොවන පුද්ගලයින් ආරක්ෂා කරයි. එමෙන්ම එමගින් තුවාල වූවන්, නැව් මුහුදුබත් වූවන්, රෝගී සටන් කරුවන් සහ යුද සිරකරුවන් වැනි තවදුරටත් සටන් නොවදින පුද්ගලයින්ව ද ආරක්ෂා කරයි.

මෙම පුද්ගල කාණ්ඩයන් ඔවුනගේ ජීවිත සහ ශාරීරික හා මානසික අඛණ්ඩතාවය උදෙසා ගරුත්වය ලැබීමට හිමිකම් කියයි. තවද ඔවුන් නෛතික ආරක්ෂණයන් භුක්ති විඳියි. සෑම අවස්ථානුගත තත්ත්වයකදී ම ඔවුන්ව ආරක්ෂා කළයුතු අතර කිසිදු වෙනස්කමකින් තොරව මානුෂීයව සැලකිය යුතුය.

වඩාත් පැහැදිලිව දක්වන්නේ නම්, සටන් කළ නොහැකි හෝ යටත්වූ ප්‍රතිවාදි සටන්කරුවකු ඝාතනය කිරීම හෝ තුවාල කිරීම තහනම්ය; රෝගී වූවන් සහ තුවාල වූවන් එක්රැස් කළයුතු අතර එලෙස එකී තැනැත්තන්ව සොයාගත් පාර්ශවය විසින් ඔවුන්ව ආරක්ෂා කළ යුතුය. සියලුම වෛද්‍ය කාර්ය මණ්ඩල, සැපයුම්, රෝහල් සහ ගිලන්රථ ආරක්ෂා කළයුතුය.

යුද සිරකරුවන් රඳවා තබා ගැනීමේ තත්ත්වයන් සහ සතුරු බලය යටතට පත් සිවිල්වැසියන් හට සැලකිය යුතු ආකාරය පාලනය කෙරෙන විස්තරාත්මක නීතිද පවතී. මෙයට ආහාර, වාසස්ථාන සහ වෛද්‍ය රැකවරණය සැපයීම මෙන්ම ඔවුනගේ පවුලේ සාමාජිකයින් සමග පණිවුඩ හුවමාරු කරගැනීමට ඇති අයිතිය පිළිබඳ විධිවිධානද ඇතුළත්ය.

මෙම නීතිය මගින් ආරක්ෂිත පුද්ගලයින්, ස්ථාන සහ භාණ්ඩ හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැකි පැහැදිලිව හඳුනාගත හැකි සංකේත විශාල ප්‍රමාණයක් දක්වයි. ප්‍රධාන ලාංඡන වනුයේ රතු කුරුසය, රතු අඩසඳ සහ සංස්කෘතික දේපළ සහ සිවිල් ආරක්ෂණ පහසුකම් හඳුනා ගැනීමට යොදා ගන්නා සංකේතයි.

**ආයුධ සහ උපායමාර්ග මත පනවා ඇති සීමා මොනවාද?**

ජාත්‍යන්තර මානුෂවාදී නීතිය විසින්:

- සටනට සහභාගී වන සහ සිවිල් වැසියන් වැනි සටනට සහභාගි නොවන පුද්ගලයින් වෙන්කොට හඳුනා ගැනීමට (අරමුණ වනුයේ සිවිල් ජනගහනය, එක් එක් සිවිල් වැසියන් සහ සිවිල් දේපළ ආරක්ෂා කිරීමයි) අසමත්වන;

- අත්‍යධික තුවාල හෝ අනවශ්‍ය දුක් පීඩා පමුණුවන;

- පරිසරයට දැඩි හෝ දිගු කාලීන හානි පමුණුවන; සියලුම යුද ආකාර සහ විධික්‍රම තහනම් කරනු ලබයි.

ඒ ආකාරයෙන් මානුෂවාදී නීතිය අද වනවිට පිපිරෙන උණ්ඩ, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි, අන්ධභාවයට පත්කරන ලේසර් කිරණ අවි සහ පුද්ගල නාශක බිම් බෝම්බ වැනි විවිධ ආයුධ ගණනාවක භාවිතය තහනම් කර තිබේ.

**සැබැවින්ම අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූලව කටයුතු සිදුවන්නේද?**

කණගාටුදායක ලෙස, අන්තර්ජාතික මානුෂවාදී නීතිය උල්ලංඝනය කළ අවස්ථා ගැණිය නොහැකි තරමට පවතී. වැඩි වැඩියෙන්, යුද වින්දිතයින් බවට පත්වනුයේ සිවිල් වැසියන්ය. කෙසේ වුවද, අන්තර්ජාතික මානුෂවාදී නීතිය විසින් සිවිල් වැසියන්, යුද සිරකරුවන්, රෝගී වූවන් සහ තුවාල වූවන් ආරක්ෂා කිරීමට සහ මිලේච්ඡ ආයුධ භාවිතය සීමා කිරීම තුළ වෙනස්කම් සිදු කළ වැදගත් අවස්ථා පවතී.

අත්‍යන්ත ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් තුළ මෙම නීති සමුදාය අදාළ වීම මතම එකී නීතිය බලාත්මක කිරීම සෑම විටම බරපතළ දුෂ්කරතාවයක්ව පවතී. එබැවින් ඵලදායී ලෙස අනුකූල කර ගැනීම උදෙසා මහත් පරිශ්‍රමයක් යෙදීම කවරදාටත් වඩා අත්‍යවශ්‍යව පවතී.

**නීතිය ක්‍රියාවට නැංවීමට කළ යුත්තේ කුමක්ද?**

අන්තර්ජාතික මානුෂවාදී නීතිය කෙරෙහි ඇති ගරුත්වය තහවුරු කිරීමට පියවර ගත යුතුය. සිය සන්නද්ධ බලකායන්ට සහ සාමාන්‍ය ජනයාට මෙම නීති පිළිබඳ ඉගැන්වීමට රාජ්‍යයන් හට බැඳීමක් පවතී. ඔවුන් විසින් නීති උල්ලංඝනය කිරීම් වළක්වාගත යුතු අතර එවැනි උල්ලංඝනය කිරීම් සිදුවන්නේ නම් අපරාධකරුවන්ට දඬුවම් ලබාදිය යුතුය.

විශේෂයෙන්ම ගත් කළ, යුද අපරාධ ලෙස සැලකෙන ජිනීවා සම්මුති සහ අතිරේක සන්ධානයන් බරපතළ ලෙස උල්ලංඝනය කිරීම් සඳහා දඬුවම් දීමට ඔවුන් විසින් නීති පැනවිය යුතුය. තවද රාජ්‍යයන් විසින් රතු කුරුසය සහ රතු අඩසඳ ලාංඡන ආරක්ෂා කිරීම සඳහා නීති සම්මත කළ යුතුය.

ජාත්‍යන්තර තලය තුළද පියවර කිහිපයක් ගෙන ඇත: මෑත කාලීන ගැටුම් ද්විත්වයක සිදු කළ ක්‍රියා සඳහා දඬුවම් දීමට අධිකරණ පත් කෙරිණි (පූර්ව යුගොස්ලෝවියාව සහ රුවන්ඩාව). 1988 රෝම ව්‍යවස්ථාව විසින් වෙනත් කරුණු අතර යුද අපරාධ මැඩ පැවැත්වීමේ වගකීම පෙරදැරිව අන්තර්ජාතික අපරාධ අධිකරණයක් නිර්මාණය කරන ලදි.

තනි පුද්ගලයින් ලෙස හෝ රජයන් සහ විවිධ සංවිධාන හරහා අප සියලු දෙනාටම අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුකූල වීමට වැදගත් දායකත්වයක් ලබා දිය හැකිය.